# අඩු වියදමකින් රතුලූණු වවන්න

**සත්‍ය බීජ නිපදවීම සඳහා වගාවක් කරන අවස්ථාවේදී ප්‍රමාණයෙන් තරමක් විශාල ළූණු බල්බ සිටුවන්න. පේළි තුළ සහ පේළි අතර සෙ.මී. 15 පමණ පරතරයක් පවත්වා ගන්න. අක්කරයකට අවශ්‍ය රතු ළූණු සත්‍ය බීජ නිපදවා ගැනීම සඳහා මීටර් 3 ෦ සෙ.මී. 75 ප්‍රමාණයේ පාත්ති 30 පමණ අවශ්‍ය වේ. බීජ ළූනු බල්ප සිටුවීමට පෙර සෙ.ග්‍රේඩ් අංශක 10-15 උෂ්ණත්වයක් යටතේ සති 3ක් පමණ ගබඩා කර තබන්න. "වසන්ති කරණය" යනුවෙන් හඳුන්වන මෙම ක්‍රියාවලිය නිසා වගාවේ මල් හට ගැනීම ඉක්මන් වනවා මෙන්ම වැඩි බීජ අස්වැන්නක් ද ලබාගත හැකිය. සුළු ප්‍රමාණයක් වගා කරන විට සාමාන්‍ය ශීතකරණයක් තුළ වුවද ළූණු බීජ බල්බ ගබඩා කර තබාගත හැකිය.**

අප රටේ රතු ලූණු සඳහා ලොකු ළූණු වලට සාපේක්ෂව හැමවිටම පාහේ වැඩි මිලක් ලැබේ. එසේම රතු ලූණු කෙරෙහි ගෘහනියන්ගේ කැමැත්ත වැඩිය. මෙම බෝගය වැඩිවශයෙන් යල කන්නයේදී ද සුළු වශයෙන් මහකන්නයේදී ද වගාවේ. 1997 වසරේ හෙක්ටයාර් 6500 පමණ වපසරියක රතු ලූනු වගා කිරීමෙන් මෙට්‍රික් ටොන් 45,000 පමණ අස්වැන්නක් ලැබී තිබේ. එය අප රටේ අවශ්‍යතාවයෙන් අඩක් පමණ ප්‍රමාණයකි. කෙසේ වුවද රතු ලූනු වගා කරන බිම් ප්‍රමාණ ක්‍රම ක්‍රමයෙන් අඩුවන බව පෙනී ගොස් ඇත.

## විශාල මුදලක්

රතු ලූනු වගා කිරීම සඳහා මුළුමනින්ම පාහේ භාවිතා කරන්නේ බීජ ලූනු බල්බය. අක්කරයක් සඳහා බීජ බල්බ කිලෝ ග්‍රෑම් 450 සිට 800 පමණ අවශ්‍ය වේ. බීජ ලූණු කිලෝ ග්‍රෑමයක මිල සාමාන්‍යයෙන් රු. 60/= ක් පමණ වන අතර, අක්කරයක් සඳහා අවශ්‍ය බීජ ලූනු සපයා ගැනීම පිණිස රු.30,000 - රු. 40,000/- පමණ විශාල මුදලක් වැය වේ.

විශාල මුදලක් වැය කළයුතු විට හා ප්‍රවාහනය, ගබඩා කිරීම වැනි කටයුතු වලදී පැන නගින දුෂ්කරතා නිසාද රතුළූනු වගාවක නිෂ්පාදන වියදමින් 60% - 65% පමණ වැය වන්නේ බීජ ලූනු බල්බ සඳහාය. මෙම හේතු නිසාත් වගා කළයුතු අවස්ථාවේදී ගුණාත්මයෙන් උසස් "බීජ ළූණු" සපයා ගැනීම දුෂ්කරවීම නිසාත්, අප රටේ රතු ලූනු වගා කරන බිම් ප්‍රමාණය පහත වැටී තිබේ.

## මල් ළූණු

දැනට අප රටේ වගා කරන රතු ලූනු වර්ග වන්නේ යාපනේ දේශීය හා වෙදලන්ය. මේ අතුරින් වෙදලන් ප්‍රභේදයෙහි මල් හටගනී. එය මල් ලූනු ලෙසද හැඳින්වේ. මෙම මල් මේරීමට පෙර නෙලා එළවළුවක් ලෙස වෙළඳපොලට යැවේ. මල් හට ගැනීම බහුල වශයෙන් සිදුවන්නේ දෙසැම්බර් - ජනවාරි වැනි කාලවලදීය.

මෙම මල් මේරීමට ඉඩදීමෙන් බීජ හටගනී. එක් මලකින් බීජ ග්‍රෑම් 1 1/2 පමණ ලබාගත හැකිය. දෙසැම්බර් මුල් කාලයේදී වේදලන් ප්‍රභේදය වගා කර ඇති සෙ.මී. 75 x මීටර් 3 ප්‍රමාණයේ පාත්තියක මල් 50 පමණ හටගනී.

## සත්‍ය බීජ මගින්

රතු ළූනු බීජ ලොකු ළූණු බීජ වලට වඩා ප්‍රමාණයෙන් තරමක් කුඩාය. ග්‍රෑමයක බීජ 275ක් පමණ අඩංගුය. මෙම බීජ ද ලොකු ළූණු බීජ මෙන්ම වගා කිරීම සඳහා භාවිතා කළ හැකිය. අක්කරයක් සඳහා අවශ්‍ය වන්නේ බීජ ග්‍රෑම් 1200 පමණ ප්‍රමාණයකි. බීජ රතු ළූණු බල්බ වලට වැයවන මුදලට වඩා ඉතා සුළු වියදමකින් මෙම රතු ළූණු සත්‍ය බීජ භාවිතා කර වගාව ආරම්භ කළ හැකිය.

සත්‍ය බීජ නිපදවීම සඳහා වගාවක් කරන අවස්ථාවේදී ප්‍රමාණයෙන් තරමක් විශාල එළූ බල්බ සිටුවන්න. පේළි තුළ සහ පේළි අතර සෙ.මී. 15 පමණ පරතරයක් පවත්වා ගන්න. අක්කරයකට අවශ්‍ය රතු එළූ සත්‍ය බීජ නිපදවා ගැනීම සඳහා මීටර් 3 x සෙ.මී. 75 ප්‍රමාණයේ පාත්ති 30 පමණ අවශ්‍ය වේ. බීජ එළූ බල්බ සිටුවීමට පෙර සෙ.ශ්‍රේඩි අංශක 10-15 උෂ්ණත්වයක් යටතේ සති 3ක් පමණ ගබඩා කර තබන්න. "වසන්ති කරණය" යනුවෙන් හඳුන්වන මෙම ක්‍රියාවලිය නිසා වගාවේ මල් හට ගැනීම ඉක්මන් වනවා මෙන්ම වැඩි බීජ අස්වැන්නක් ද ලබාගත හැකිය. සුළු ප්‍රමාණයක් වගා කරන විට සාමාන්‍ය ශීතකරණයක් තුළ වුවද එළූ බීජ බල්බ ගබඩා කර තබාගත හැකිය.

## වර්ෂාවෙන් රැකගන්න

වගුවේ මල් හටගත් විට පාත්තියට ඉහළින් පොලිතීන් ආවරණයක් යෙදීමෙන් වර්ෂාවෙන් මල් ආරක්ෂා කරගත හැකිය. වගාවට වැළඳිය හැකි දම් පැල්ලම් රෝගය පාලනය කර ගැනීම සඳහා නිර්දේශිත දිලීර නාශකයක් යොදන්න. මල්වල හටගන්නා බීජ මේරූ පසුව මල් නෙලා බීජ එකවරම තවාන් කළ හැකිය. නැතහොත් සිසිල් වියලි ස්ථානයක ගබඩා කර තබාගත හැකිය.

මේ අන්දමට නිපදවාගන්නා රතුඑළූ බීජ සාමාන්‍ය ලොකු එළූ බීජ තවාන් කරන අන්දමට සකස් කරගත් පාත්තිවල සිටුවන්න. දින 45 පමණ ගතවූ එළූ පැල සෙ.මී. 8 • 8 පරතරයට ක්ෂේත්‍රයේ සිටුවන්න. මේ අනුව පැහැදිලිවන කරුණක් නම් බීජ බල්බ වෙනුවට සත්‍ය බීජ භාවිතා කර රතු එළූ වගාවක් ආරම්භ කිරීම මගින් නිෂ්පාදන වියදම් විශාල වශයෙන් අඩුකර ගත හැකි බවයි.

## සෙත් පිරිත් බලෙන් රෝස වගාව සරුවෙයි

තම ගොවිපළෙහි, පටිගත කළ සෙත්පිරිත් දේශනා වාදනය කැරවීමෙන් පසු එහි වගාකෙරෙන රෝසමල් පිරිපුන්ව පිපෙන්නට පටන්ගත් බව තායිවාන ගොවියෙක් කියා සිටී.

බෞද්ධ බැතිමතකු වන පැන්-වෙන් පින් නම් වේ. ගොවියා පවසන පරිදි තමරෝස වගාවට පලිබෝධ නාශක ඉසීමෙන් මියගිය පණුවන්ගේ ආත්ම සතසනු පිණිස දැනට වසරකට පෙරදී ඔහු වගාබිමේ සෙත් පිරිත් වාදනය කර ඇත. ඔහුගේ රෝස වගාව පිහිටියේ චන්ගුහා ප්‍රාන්තයේය. මේ පිරිත් දේශනාවෙන් පසු පුදුමයකට මෙන් පෙර නොවූ විරූ පරිද්දෙන් වඩාත් අලංකාරවත් අන්දමින් රෝස මල් පිපෙන්නට වූ බව ඔහු පවසයි.